**ශීර්ෂය 101 - බුද්ධ ශාසන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 101 - බුද්ධ ශාසන අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුලි 04 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රුපියල් මිලියන 832.3 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රුපියල් මිලියන 799.7 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රුපියල් මිලියන 32.6 ක් හෙවත් සියයට 4 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 179.5 | 159.2 | 20.3 | 11.3 |
| මූලධන | 652.8 | 640.5 | 12.3 | 1.9 |
| **එකතුව** | **832.3** | **799.7** | **32.6** | **3.9** |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 10101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 6.85 | 4.46 | 3.25 | 3.87 | 23.00 | 12.25 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

අමාත්‍යාංශය යටතේ වන 2015 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 26.95 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුමේ අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0002/0058/000 | 0.17 |
| 6000/0000/00/0016/0013/000 | 24.03 |
| 6000/0000/00/0018/0013/000 | 2.75 |
| **එකතුව** | **26.95** |

**2.4 විගණන නිරීක්ෂණය**

බුද්ධශාසන අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමණාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමණාකරන විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණි.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

### 3.2 විගණන විමසුම්වලට පිළිතුරුදීම

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී නිකුත් කරන ලද විගණන විමසුම් 04 කට 2016 මාර්තු 31 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.10,115,163 ක් වී තිබුණි.

### 3.3 විසර්ජන ගිණුම

වැය විෂයයන් 16 ක් සඳහා අධි පතිපාදන සළසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 24 ක සිට සියයට 88 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

### 3.4 පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.13,456,326 ක්වූ තැන්පතු 13 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 10101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශයට අනුව සේවය අතහැර ගිය හා වෙනත් සේවාවන්ට මුදාහරින ලද නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු වසරකට අධික කාලයක සිට පැවත එන එකතුව රු.136,368 ක් වූ ණය ශේෂ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.6.1 අභ්‍යන්තර විගණනය**

අමාත්‍යාංශය, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව සහ බුද්ධශාසන අරමුදල සම්බන්ධයෙන් ක්ෂේත්‍ර 19 ක් ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනය සැලැසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණන පරීක්ෂණ 5 ක් පමණක් සිදු කර තිබුණි. අමාත්‍යාංශය විසින් මෙහෙයවන ව්‍යාපෘති, සංවර්ධන කටයුතු හා පරිපාලන කටයුතු පිළිබද ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**3.6.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 ජුනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.7 වත්කම් කළමනාකරණය**

**බේරුම් නොකළ බැරකම්**

අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයකට අඩු කාලයක සිට පැවත එන රු.2,126,019 ක් වූ බැරකම් තිබුණි.

**3.8 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| **(අ)** මුදල් රෙගුලාසි 94(1) | 451,021 | වැය විෂයයන් 05 ක් සදහා සළසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කළ පසු ඉතිරිවීම් රු.451,021 කින් ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) මුදල් රෙගුලාසි 371 | 292,000 | මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ට පමණක් තත්ත්කාර්ය අතුරු අග්‍රිම ගෙවිය හැකි වුවත්, උපදේශක ලෙස බඳවාගත් බාහිර පුද්ගලයකුට අවස්ථා 2 ක දී එකතුව රු.292,000 ක තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. |

**3.9 කාර්යසාධනය**

**3.9.1 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

අමාත්‍යාංශය සිය අරමුණුවලට අදාල කාර්යවලින් බැහැරව ක්‍රියා කළ අවස්ථා නිරීක්ෂණය වූ අතර, නියැදි විගණන පරීක්ෂණවලදී එසේ අනාවරණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) **"බොදු බැති ගීතය" සඳහා අනුග්‍රාහක දීමනා ගෙවීම.**

පෞද්ගලික කණ්ඩායමක් විසින් කරන ලද යෝජනාවක් අනුව 2015 වර්ෂයේ ජාතික වෙසක් උත්සවයට සමගාමීව "බොදු බැති ගීතය" එළිදැක්වීමට අමාත්‍යාංශය විසින් අනුග්‍රාහක දීමනාවක් ලෙස රුපියල් මිලියනයක් ගෙවා තිබුණි. බොදු බැති ගීතය නිර්මාණය සඳහා ඇස්තමේන්තුගත වියදම රු.8,050,000 ක් නැවත උපයා ගැනීම සඳහා වූ ක්‍රියාමාර්ග එම කණ්ඩායම විසින් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණද, ගීතයේ අයිතිය පිළිබද හෝ ආදායම රාජ්‍ය ආදායමට ලබාදීම පිළිබදව හෝ කිසිදු එකඟතාවකට අමාත්‍යාංශය එළඹ නොතිබුණි. ඒ අනුව පෞද්ගලික කණ්ඩායමක් විසින් ආදායම් බලාපොරොත්තුවෙන් කරන ලද කාර්යයක් සඳහා අමාත්‍යාංශය විසින් රජයේ අරමුදල් වැය කර තිබුණි. එසේ වුවද 2015 වර්ෂයේ වෙසක් උත්සවය නිමිත්තෙන් ගීතය එළිදක්වන බව දක්වා තිබුණද, ගීතය සම්බන්ධයෙන් බලාපොරොත්තු වූ නිර්මාණ කටයුත්ත 2016 මැයි 31 දින වන විටත් අවසන් කර නොතිබුණි.

**(ආ) 2015 වර්ෂයේ බොදු දිනපොත් මුද්‍රණය කර බෙදා හැරීම.**

2015 වර්ෂය සඳහා බොදු දිනපොත් 26,500 ක් හා ඇමතුම් දිනපොත් 12,500 ක් මුද්‍රණය කිරීම සඳහා බුද්ධශාසන අමාත්‍යාංශය විසින් රු.6,590,500 ක් ද, දිවයින පුරා එම දිනපොත් බෙදා හැරීම සඳහා රු.613,000 කට ආසන්න වියදමක්ද කර තිබුණි. මෙහිදි බෞද්ධ සංස්කෘතික වටිනාකම හා සම්බන්ධ ප්‍රදර්ශන පැවැත්වීම සඳහා සළසා තිබුණු රු.2,250,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඒ සඳහා යොදවා ගෙන තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත නිශ්චිත අරමුණක් වෙනුවෙන් සළසා දී තිබුණු ප්‍රතිපාදන වර්ෂය ආරම්භයේදීම මුළුමනින්ම වෙනත් කටයුතු සඳහා උපයෝජනය කර තිබු බව නිරීක්ෂණය විය.

### 3.9.2 ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

අමාත්‍යාංශය විසින් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුකර නොතිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථාවක් පහත දැක්වේ.

**දහම් පාසල් ආධාර ලබාදීම**

මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් බල ප්‍රදේශයේ විහාරස්ථාන කිහිපයක් පිළිබඳ නියැදි විගණන පරීක්ෂණවලදී පහත දැක්වෙන අඩුපාඩු අනාවරණය විය.

(අ) 2015 වර්ෂයේ දහම් පාසල් ආධාර ලබාදීමට සුදුසු දහම් පාසල් ප්‍රමුඛතා ලේඛනය හා දහම් පාසල් ආධාර ලබාදුන් ලේඛනයට අනුව ප්‍රමුඛතා ලේඛනයේ ඇති විහාරස්ථානයන්ට ආධාර ලබා දී නොතිබූ අතර ප්‍රමුඛතා ලේඛනයේ නොතිබූ දහම් පාසල් සඳහා ආධාර මුදල් ලබා දී තිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන් සම්බන්ධව කටයුතු කිරීමේදී කාලීනව, අවශ්‍යතා පරිදි ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා නොතිබුණි. මේ හේතුවෙන් එම නිලධාරීන්ගේ රාජකාරි ගැටළු නිරාකරණය කර ගැනීමේ අපහසුතා මතුවී පැවති අතර එසේ එම ගැටළු විසඳීමකින් තොරව කල්ගත වීම හේතු කොට ගෙන තවත් විවිධ ගැටළු මතු වී තිබූ බව නිරීක්ෂණය විය.

### 3.10 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

### 3.10.1 රාජ්‍ය වෙසක් උත්සවය - 2015

2015 වර්ෂයේ රාජ්‍ය වෙසක් උත්සවය පැවැත්වීම සඳහා අනුග්‍රාහක හවතුන්ගෙන් හා භාණ්ඩාගාර ප්‍රදාන ලෙස රු.34,071,000 ක් බුද්ධශාසන අමාත්‍යාංශය වෙත ලැබී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය වෙසක් උත්සවයේ වියදම් දැරීම සඳහා 2015 අප්‍රේල් 15 දිනැති පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් රු.21,071,000 ක ප්‍රතිපාදන බුද්ධශාසන අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණි. එම ප්‍රතිපාදනවලින් විගණන දින වන විට රු.7,935,236 ක් ඉතිරි වී තිබුණු අතර වෙසක් උත්සවය සඳහා සියළු වියදම් ඒ වන විට සිදු කර තිබුණි. මේ අනුව රාජ්‍ය වෙසක් උත්සවය සඳහා වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේ දී හා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමේ දී අධි ඇස්තමේන්තු කිරීමක් සිදු කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) තවද, එවකට විෂයයභාර අමාත්‍යවරයා විසින් සිදු කරන ලද ලිඛිත ඉල්ලීම්වලට අනුව රාජ්‍ය ආයතන 4 කින් 2015 රාජ්‍ය වෙසක් උත්සවය සඳහා රු.13,000,000 ක මූල්‍යාධාර ලැබී තිබුණි. රාජ්‍ය වෙසක් උත්සවය සඳහා රජයෙන් ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් වී තිබුණු බැවින් මෙම ප්‍රදාන වැය කර නොතිබුණි. එම ලැබීම්, රාජ්‍ය ආදායම් ලෙස ගිණුම්ගත නොකර බුද්ධශාසන අරමුදල වෙත ලබාදී තිබුණි.

**3.10.2 අමාත්‍යාංශය සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කිරීම**

---

අමාත්‍යාංශය හා එවකට අමාත්‍යාංශය යටතේ තිබූ දෙපාර්තමේන්තු 05 ක් සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කිරීමට 2013 හා 2014 වර්ෂවලදී එකතුව රු.3,807,000 ක් ගෙවා තිබුණි. මෙම ගෙවීම් සම්බන්ධව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තාක්ෂණික ඇගැයීම් කමිටුවක් පත් කර අවශ්‍ය තාක්ෂණික පිරිවිතර සකස් කිරීමෙන් තොරව හා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව තෝරා ගන්නා ලද සැපයුම්කරුවන් තිදෙනෙකුගෙන් මිල ගණන් විමසීමෙන් පසුව අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සැපයුම්කරුවෙකු තෝරාගෙන තිබුණි.

(ආ) සැපයුම්කරු විසින් සකස් කරන ලද වෙබ් අඩවිය, මෘදුකාංග තාක්ෂණික නිලධාරියෙකුගේ හෝ ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂඥවරයෙකුගේ අධීක්ෂණයට ලක් කිරීමෙන් තොරව රු.804,000 ක් ගෙවා තිබුණි. අමාත්‍යාංශය යටතේ තිබූ දෙපාර්තමේන්තු 5 ක් සඳහාද වෙබ් අඩවිය සංවර්ධනය කිරීම සඳහා මුල් සැපයුම්කරුටම ලබාදී තවත් රු.3,003,000 ක් ගෙවා තිබුණි. එහෙත් දෙපාර්තමේන්තු සඳහා වෙබ් අඩවි නිර්මාණය කර භාරදී නොතිබුණු අතර අමාත්‍යාංශය සඳහා නිර්මාණය කළ වෙබ් අඩවියද මාස 6 ක කාලයක් ඉක්ම ගිය පසු ක්‍රියාත්මක නොවන තත්ත්වයක් උද්ගත වී තිබුණි.

**3.11 අවිධිමත් ගනුදෙනු**

---

**3.11.1 දහම් පාසල් හා පන්සල් සංවර්ධන කටයුතු වෙනුවෙන් ආධාර ලබාදීම**

---

**පුවක්පිටිය රංවල පහන දේවාල පරිශ්‍රය සඳහා බහුකාර්ය ගොඩනැගිල්ලක් ඉදිකිරීම**

---

ඉහත සඳහන් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2015 ඔක්තෝබර් මාසයේදී අමාත්‍යාංශය විසින් රු.1,000,000 ක ප්‍රතිපාදන හංවැල්ල ප්‍රාදේශීය ලේකම් වෙත ලබාදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වූ සැලැසුම, අදාල ප්‍රාදේශීය සභාවෙන් අනුමත කර නොගෙන ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණි.

(ආ) දුම්රිය මාර්ගයක් ආසන්නයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීමේදී ඉඩහැරිය යුතු සීමාව තුළ මෙම ගොඩනැගිල්ල ඉදිකර තිබුණි. කැළණිවැලි දුම්රිය මාර්ගය ද්විත්ව මාර්ගයක් බවට පත් කිරීමේ සැලැසුමක් දැනට ක්‍රියාත්මක වෙමින් පවතින බැවින්ද, ඉදිකිරීමට අදාල ඉඩම පහත් බිමක පිහිටා ඇති බැවින් පහත් බිම් සංවර්ධන මණ්ඩලයෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. ඒ අනුව මෙම ඉදිකිරීම් ආරම්භ කිරීම නීත්‍යානුකූල වී නොතිබුණි.

(ඇ) මෙම ඉඩමට පිවිසීම සඳහා මාර්ගයක් සකස් කර නොතිබුණු අතර ආධාර ලබාදීමේදී ඉදිකිරීමට අවශ්‍ය මූලික අවශ්‍යතා සපුරා ඇති බවට තහවුරු කර ගැනීමකින් තොරව අරමුදල් ලබාදී තිබුණි .

**3.11.2 තොරතුරු තාක්ෂණ අංශය සහ පුණ්‍යග්‍රාම වැඩසටහන සඳහා උපදේශකවරයෙකු පත් කිරීම**

**-----------------------------------------------------------------------------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය විසින් මෙහෙයවිය යුතු වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සඳහා අමාත්‍යාංශයේ සේවයේ නියුතු මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් සිටියදී උපදේශකවරයෙකු ලෙස අවිධිමත් පරිදි බඳවාගත් හිමිනමකට පුණ්‍යග්‍රාම ව්‍යාපෘතියේ සියළුම කාර්යයන් බාරදී තිබුණි. උක්ත උපදේශක හිමි විසින්, ඉදිරිපත් කරන ලද බිල්පත් හා ඉල්ලීම් පිළිගෙන එම උපදේශක හිමිනමට වූ බැංකු ගිණුමකට රු.3,424,404 ක් හා එම උපදේශක විසින් සභාපතිධුරය දරන පෞද්ගලික සමාගමක් වෙත රු.761,277 ක මුදලක් මුදා හැර තිබුණද එම කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් විධිමත් අධීක්ෂණයක් සිදු කර නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව පුණ්‍යග්‍රාම වෙබ් බිහිදොර නමින් වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන යාම සඳහා ඉහත (අ) හි සඳහන් උපදේශක වෙත රු.1,505,202 ක් අවිධිමත් ලෙස ගෙවා තිබුණි. එම වෙබ් අඩවියට අදාල දත්ත පද්ධතිය අමාත්‍යාංශය වෙත භාර දී නොතිබුණු අතර වෙබ් අඩවිය ක්‍රියාත්මක තත්ත්වයේ ද නොතිබුණි.

**3.11.3 ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ 150 වෙනි ජන්ම දින සංවත්සරය සැමරීම - 2015**

**-----------------------------------------------------------------------------------------------**

උක්ත කාර්යය සඳහා රු.10,000,000 ක ප්‍රතිපාදන 2015 වාර්ෂික ඇස්තමේන්තුවෙන් සළසා තිබුණු අතර එම ප්‍රතිපාදනවලින් 2015 වර්ෂයේ දී කරන ලද වියදම් පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) 2014 වර්ෂයේ පවත්වන ලද ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ ජන්ම දින උත්සවය සැමරීම හා බෞද්ධ සාහිත්‍ය උත්සවය සඳහා සමස්ථ ලංකා බෞද්ධ මහා සම්මේලනය විසින් ඉදිරිපත් කර තිබූ රු.3,189,858 ක වියදම් වාර්තාවක් සඳහා රු.2,000,000 ක් බුද්ධශාසන අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි. විධිමත් පරිදි රු.1,561,264 ක වියදම් සඳහා බිල්පත් ඉදිරිපත් කර තිබුණත් රු.438,736 ක වියදම් වෙනුවෙන් බිල්පත් ලබා ගෙන නොතිබුණි.

(ආ) ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ අනුස්මරණ දේශක පුහුණු ව්‍යාපෘතියේ දේශකවරුන් සඳහා සම්පත් දායක දීමනා ලෙස රු.129,000 ක් ද ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමාගේ චරිතාපදාන වාර්තා චිත්‍රපටය දෙමළ භාෂාවෙන් හඩ කැවීම් සඳහා රු.60,000 ක් ද එතුමාගේ 150 වැනි ජන්ම දින සංවත්සරික ජාතික පරිසංවාදය 2015 වර්ෂය සඳහා වියදම් දැරීම වෙනුවෙන් රු.1,000,000 ක් ද වශයෙන් එකතුව රු.1,060,000 ක් රජයේ විශ්වවිද්‍යාලයක රැස් කිරීමේ ගිණුමකට හා ස්වාමීන් වහන්සේ නමකට ගෙවා තිබුණි. උක්ත සේවාවන් ලබා ගැනීම සඳහා වූ බිල්පත් අදාල සේවා සැපයුම් ආයතනයන් වෙතින් ලබා ගෙන නොතිබුණු අතර එම කටයුතු පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණි.

(ඇ) බුද්ධශාසන අමාත්‍යාංශය හා රජයේ විශ්වවිද්‍යාලයක් ඒකාබද්ධව 150 වන අනගාරික ධර්මපාල සංවත්සරික ජාතික පරිසංවාදය පදනම් කරගෙන උප මාතෘකා 4 ක් යටතේ "අනාගතය සඳහා අනගාරික ධර්මපාල දැක්ම" නමින් පර්යේෂණ පත්‍රිකා තරඟයක් සංවිධානය කර තිබුණි. එම තරඟය සඳහා ලියාපදිංචි ගාස්තු ලෙස සාක් රටවල් පර්යේෂකයන්ගෙන් ඇමරිකානු ඩොලර් 100 ක් ද, අනෙකුත් රටවල්වල පර්යේෂකයන්ගෙන් ඇමරිකානු ඩොලර් 200 ක් ද හා දේශීය පර්යේෂකයන් ගෙන් රු.2, 000 ක් ද වශයෙන් ගාස්තු රැස් කිරීම අදාල විශ්වවිද්‍යාලයේ ජන

සංනිවේදන අධ්‍යයන අංශය මගින් සිදු කරන බව සඳහන් කර තිබුණි. බුද්ධශාසන අමාත්‍යාංශය විසින් මෙම වැඩ සටහන සඳහා මුල්‍ය දායකත්වය ලබා දී තිබුණු අතර එම වැඩ සටහන පාදක කරගෙන රැස් කරන ලද ඉහත සඳහන් මුදල් පිළිබඳ කිසිදු වාර්තාවක් අමාත්‍යාංශය වෙත ලබා ගෙන නොතිබුණි.

**3.11.4 ගම්පොල දොළුව ශ්‍රී බිම්බාරාම විහාරස්ථානයේ ශ්‍රී සුමණ දහම් පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීම**

---

උක්ත විහාරස්ථානය විසින් පවත්වාගෙන යන දහම් පාසල සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු වෙත අදියර 02 ක් යටතේ එකතුව රු.32,102,409 ක එකතු කළ අගය සහිත බදු ඇතුළත්ව ගෙවා තිබුණි. එම ගෙවීම් සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 මාර්ගෝපදේශය ප්‍රකාරව තරඟකාරි ලංසු කැඳවීමෙන් තොරව හා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා උපදේශකවරයෙකු පත් කර තිබුණි. එමෙන්ම අමාත්‍යාංශයට හෝ විහාරස්ථානයට නීත්‍යානුකූල හිමිකමක් නොමැති භූමියක මෙම ගොඩනැගිල්ල ඉදිකර තිබුණි.

(ආ) ගොඩනැගිල්ල ඉදිකිරීමට පෙර විධිමත් පරිදි අදාල පාර්ශවයන් සමඟ එකඟතාවයකට නොපැමිණීම හේතුවෙන් ඉදිකිරීම් අතරතුරදි සැලැසුම් වෙනස්කර තිබුණු අතර එහිදි ව්‍යාපෘතිය අදියර 2 ක් යටතේ නිමකිරීමට සිදුවී තිබුණි. ඒ සඳහා රු.11,616,302 ක අමතර වියදමක් කර තිබුණි. මේ අනුව ප්‍රධාන ගොඩනැගිල්ලේ දිග ප්‍රමාණය මුල් සැලැස්මට වඩා 1/5 ක් වැඩි කිරීම සඳහා රු.11,616,302 ක් වැය කර තිබුණි.

(ඇ) මුල් සැලැස්ම අනුව ගොඩනැගිල්ලේ පලමු අදියර සඳහා කොන්ත්‍රාත්කරුට රු.18,633,092 ක් ගෙවා තිබූ අතර, එම මුදලට ගොඩනැගිල්ලේ කාර්යයන් නිමකර නොතිබුණි. ප්‍රධාන ගොඩනැගිල්ලේ දිග 1/5 ක ප්‍රමාණයක් වැඩි කිරීම සඳහා රු.11,616,302 ක් වැය කර තිබුණි. ගොඩනැගිල්ලේ 1/4 ක ප්‍රමාණයක වැඩ නිමකිරීම සඳහා රු.25,602,633 ක වියදම හා සැසඳීමේදී පසුව ඉදිකල කොටස සඳහා වූ වියදම අසාමාන්‍ය තත්ත්වයක් බව නිරීක්ෂණය විය.

**3.12 අනාර්ථික ගනුදෙනු**

---

**3.12.1 මිරිසවැටිය භික්ෂු පුහුණු මධ්‍යස්ථානය හා යාබද තාප්පය ඉදිකිරීම.**

---

බුද්ධශාසන අමාත්‍යාංශය විසින් අනුරාධපුර මිරිසවැටිය මහා විහාරයේ භික්ෂු පුහුණු මධ්‍යස්ථානය, භික්ෂු නේවාසිකාගාරය හා යාබද තාප්පය ඉදිකිරීමේ කටයුතු අදියර 2ක් යටතේ නිම කිරීමට සැලැසුම් කර තිබූ අතර ඒ සඳහා 2011 වර්ෂයේ සිට 2015 නොවැම්බර් මාසය දක්වා රු.32,494,501 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) අමාත්‍යාංශය විසින් රු.17,727,403 ක් වැය කර පළමු අදියර යටතේ ඉදිකරන ලද ගොඩනැගිල්ල කොන්ත්‍රාත්තුව අවසන්වීමෙන් පසුව, මිරිසවැටිය රජමහා විහාරය වෙත භාරදී තිබුණි. නමුත් එහි සවිකර තිබූ දොරවල්, යකඩ ආවරණ සහ වැහිපීලිවල දෝෂ තත්ත්වයන් නිවැරදි කරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබූ අතර, රු.992,734 ක රැඳවුම් මුදල අවස්ථා දෙකකදී කොන්ත්‍රාත් සමාගම වෙත ගෙවා තිබුණි.

(ආ) මිරිසවැටිය ව්‍යාපෘතියේ දෙවන අදියර ලෙස භික්ෂු පුහුණු මධ්‍යස්ථානයට යාබදව කොටසක් සාදා නිම කර තිබු ගොඩනැගිල්ලේ ඉතිරි කොටස භික්ෂු නේවාසිකාගාරයක් ලෙස සංවර්ධනය කිරීම සහ ගොඩනැගිල්ල පිහිටි භූමිය වටා තාප්පයක් ඉදිකිරීමට සැලැසුම් කර තිබුණි. ඊට අදාල කොන්ත්‍රාත් ගිවිසුම් හා ගෙවීම් පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(i)** ඇස්තමේන්තුගත වටිනාකම රු.16,355,972 ක් වු ව්‍යාපෘතියේ දෙවන අදියර සඳහා ලංසු කැඳවීමෙන් තොරව, පළමු අදියරේ ඉදිකිරීම සිදු කළ කොන්ත්‍රාත් සමාගමටම ඉදිකිරීම් කටයුතු භාර දී තිබුණි.

**(ii)** භික්ෂු පුහුණු මධ්‍යස්ථානය වටා බැම්ම ඉදිකිරීම සඳහා රු.2,640,792 ක් වැය කර තිබුණි. කාර්ය ආරම්භ කිරීමට පෙර අමාත්‍යාංශය විසින් භූමියේ හිමිකාරත්වය පිළිබඳව සැලකිල්ලක් දක්වා නොතිබීම හේතුවෙන් මෙම කාර්යය අතරමග නවතා තිබුණි.

**3.13 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 16 | 10 | 06 |
| (ii) තෘතියික මට්ටම | 02 | - | 02 |
| (iii) ද්විතියික මට්ටම | 140 | 79 | 61 |
| (iv) ප්‍රාථමික මට්ටම | 36 | 33 | 03 |
| (v) වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 04 | 04 | - |
| **එකතුව** | **198** | **126** | **72** |